විසර්ජන ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

දිළිඳුකම අඩු කිරීම සඳහා වන මූල පිරීම,

මැතිවරණ සම්බන්ධීකරණය,

සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය,

ආපදා සහන ව්‍යාපෘතින් හා පුනරුත්ථාපන ව්‍යාපෘතින් පරිපාලනය,

දිස්ත්‍රික් ව්‍යාපෘතින් පරිපාලනය හා මග පෙන්වීම හා ආදායම් එකතු කිරීම.

1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) සීතාවක
(ආ) පාදුක්ක
(ඇ) රත්මලාන
(ඈ) මහරගම
(ඉ) මොරටුව
(ඊ) දෙහිවල
(උ) කඩුවෙල
(ඌ) කොළඹ
(එ) ශ්‍රී ජයවර්ධනපුර
(ඒ) කැස්බෑව
(ඔ) හෝමාගම
(ඕ) කොලොන්නාව
(ක) තිඹිරිගස්යාය.

1.3 විගණන විෂය පථය

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛණ හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් මස 18 වැනි දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**1.4 <u>ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම</u>**

විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන් , වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**1.5 <u>විගණන නිරීක්ෂණ</u>**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **<u>ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම</u>**

2012 දෙසැම්බර් 31 දින වන විට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අස්ථාන ගත වවුචර් 145 ක වටිනාකම රු.5,040,360 ක් වූ අතර එම කාර්යාලයේ 2012 නොවැම්බර් 26 දින ඇතිවූ හදිසි ගින්නක් හේතුවෙන් අදාල අනෙකුත් සාක්ෂිද විනාශ වී තිබූ බැවින් මේ පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(ආ) **<u>විසර්ජන ගිණුම</u>**

**(i)** <u>මුළු ප්‍රතිපාදනය හා වියදම</u>

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.764,042,714 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.686,363,290 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම්

රු.77,679,424 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 10% ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 444,550,000 | 549,042,714 | 8,927,047 | 2 |
| මූලධන | 215,000,000 | 215,000,000 | 68,752,377 | 32 |
| | --------------- | --------------- | -------------- | |
| එකතුව | 659,550,000 | 764,042,714 | 77,679,424 | |
| | ========= | ========= | ========= | |

(ii) අයවැය විචලනය

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 45 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(iii)** වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාශ 18 කින් හා දෙපාර්තමේන්තු 09 කින් පිළිවෙලින් රු.2,702,793,214 කින් හා රු.3,248,048,200 කින් සමන්විත එකතුව රු.5,950,841,414 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර, එයින් පිළිවෙලින් රු.2,552,131,310 කින් හා රු.3,102,391,960 කින් සමන්විත එකතුව රු.5,654,523,270 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.296,318,144 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

ඒ සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

ශීර්ෂ අංක 105-02-1-1-2105(1) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දිවි නැගුම සත්ව පාලනය වැඩ සටහන යටතේ රු.10,000,000 ක ප්‍රතිපාදිත මුදලින් රු. 6,128,500 ක වියදමක් දරමින් සිදු කරන ලද කුකුල් පැටව් බෙදාදීමේ ව්‍යාපෘතියේදී පුහුණු වැඩ සටහන් සඳහා සියළු ප්‍රතිලාභීන්

සහභාගීකර ගනිමින් වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම , කුකුළු පැටවුන් ඇති කිරීමේ පහසුකම් පිළිබඳව පරික්ෂා නොකිරීම, කුකුළු පැටව් බෙදාදීමේදී පිරිමි හා ගැහැණු සතුන් නිසි අනුපාතික ක්‍රමයකට ප්‍රතිලාභීන් සඳහා ලබාදීමට කටයුතු නොකිරීම , බෙදාදීම සඳහා තෝරා ගෙන ඇති කුකුළු පැටව් වර්ගය අනුව ඉදිරි කාලය සඳහා පැටව් බෝකිරීමේ හැකියාව එම වර්ගයේ සතුන් තුල නොමැතිවීම හා ව්‍යාපෘතියේ පසු විපරම් කටයුතු ක්‍රමවත්ව සැලසුම් සහගතව ඉටුකර ගැනීමට නිලධාරින්ගේ නිසි දායකත්වය නොලැබීම ආදී කරුණුවල බලපෑම මත වැඩ සටහනේ අපේක්ෂිත අරමුණු කරා ළඟාවීමට නොහැකි තත්ත්වයක් පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) <u>රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම</u>

<u>පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණ සීමාවන්</u>

විෂය අංක 25501 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම් | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු | රු. | රු. | රු. | රු. |
| 47,000,000 | 35,901,178 | 34,000,000 | 36,421,071 | 186,000,000 | 165,487,614 |

(ඈ) <u>පොදු තැන්පත් ගිණුම්</u>

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.522,953,937 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6003/0/0/1/0 | (20,795) |
| 6003/0/0/31/0 | 518,492,289 |
| 6003/0/0/1/0/4 | (4,482,442) අක්‍රියව පවතින තැන්පත් ගිණුමකි. |
| 6003/0/0/1/4/0 | 8,964,885 අක්‍රියව පවතින තැන්පත් ගිණුමකි. |

පහත නිරීක්ෂනය කරණු ලැබේ.

දෙපාර්තමේන්තු පොත් අනුව 2012 දෙසැම්බර් 31 දිනට අංක 6003/0/0/1/0 දරන පොදු තැන්පත් ගිණුම් ශේෂය රු. 20,795 ක හර ශේෂයක් වූ අතර භාණ්ඩාගාර පොත් අනුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.14,503,238 ක් විය. මේ අනුව භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු පොත් අතර රු.14,482,442 ක වෙනසක් පවතින බව නිරීක්ෂණය විය.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත් එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.6.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුලත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජුලි 09 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.7 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට පාඩු පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන පිළිවෙලින් වසර 05 ට අඩු හා වසර 05 ත් 10 ත් අතර රු.468,718 ක හා රු.170,835 ක අලාභහානි අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 නොවැම්බර් 26 දින කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීම හේතුවෙන් ගොඩනැගිල්ලට සිදුවූ හානිය ලෙස තක්සේරු දෙපාර්තමේන්තුව තක්සේරු කර ඇති පරිදි රු.76,000,000 ක් හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩවලට සිදුවූ අලාභය ලෙස මු.රෙ.104(4) ට අනුව පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාවට අනුව රු.16,606,688 ක් ලෙසද වාර්තා කර ඇති අතර මේ අනුව සම්පූර්ණ අලාභයේ එකතුව රු.92,606,688 ක් වන බව නිරීක්ෂණය වුවද, ඊට අදාල මු.රෙ.104(4) පූර්ණ වාර්තාව 2013 ඔක්තෝබර් 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

1.8 <u>මානව සම්පත් කළමනාකරණය</u>

(අ) <u>අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා</u>

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 63 | 63 | 02 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 24 | 18 | 06 | -- |
| (iii) | ද්විතියක මට්ටම | 1105 | 883 | 228 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 133 | 121 | 12 | -- |
| | එකතුව | 1325 | 1085 | 248 | 08 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 248 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ii) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.